දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
DISTANCE AND CONTINUING EDUCATION UNIT – UNIVERSITY OF RUHUNA

සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධි ප්‍රථම භාග (බාහිර) පරීක්ෂණය - 2014 පෙබරවාරි/මාර්තු
Bachelor of Arts Degree (External) Part I Examination - February/March 2014

දේවිසා 2.2 - රාජ්‍ය පරිපාලනයේ මූලිකාංග
PSG 2.2 - Elements of Public Administration

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

---

01. රාජ්‍ය පරිපාලනය නිර්වචනය කොට වර්තමාන රාජ්‍යය තුළ රාජ්‍ය පරිපාලනයෙහි කාර්යභාරය විභාග කරන්න.
(ලකුණු 20 යි)

02. දේශපාලනය සහ පරිපාලනය අතර සම්බන්ධය ශ්‍රී ලංකාවේ දේශපාලන සන්දර්භය කෙරෙහි අවධානය යොමු කරමින් විශ්ලේෂණය කරන්න.
(ලකුණු 20 යි)

03. ෆෙඩ්රික් ටේලර්ගේ විද්‍යාත්මක කළමනාකරණවාදයේ මූලික සලකා බැලීම් මොනවා ද?
(ලකුණු 20 යි)

04. "රාජ්‍ය පරිපාලනය සහ ව්‍යාපාර පරිපාලනය එකිනෙකින් වෙන් කළ නොහැකි ක්ෂේත්‍ර දෙකකි." නූතන ප්‍රවනතා කෙරෙහි අවධානය යොමු කරමින් මෙම ප්‍රකාශය විභාග කරන්න.
(ලකුණු 20 යි)

05. "පරිපාලන සංවිධානයක ක්‍රියාකාරී පැවැත්ම එහි ව්‍යුහාත්මක සැකැස්ම මතම පමණක් තීන්දු නොවේ" අදහස් දක්වන්න.
(ලකුණු 20 යි)

06. සංවිධාන න්‍යාය ආශ්‍රයෙන් පහත සඳහන් මූලධර්ම පැහැදිලි කරන්න.
(i) සංවිධාන ධූරාවලිය
(ii) අණදීමේ ඒකීයත්වය
(iii) සම්බන්ධීකරණය
(iv) සීමිත හැසිරවීමේ ප්‍රමාණය
(ලකුණු 05 බැගිනි)

07. මහා බ්‍රිතාන්‍යය තුළ සිවිල් සේවාවේ වර්ධනය උදෙසා 1854 නෝර්ත්කෝට්-ට්‍රෙවලියන් වාර්තාව මගින් හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණවල වැදගත්කම පැහැදිලි කරන්න.
(ලකුණු 20 යි)

08. "ප්‍රංශ පරිපාලනයේ සුවිශේෂී ලක්ෂණ එරටටම ආවේනික ඒවා වේ" විශ්ලේෂණය කරන්න.
(ලකුණු 20 යි)

09. ශ්‍රී ලංකාවේ පරිපාලන ක්‍රමයේ විකාශනය සහ එහි වත්මන් ක්‍රියාකාරිත්වය විවේචනාත්මකව විමසන්න.
(ලකුණු 20 යි)

10. පහත සඳහන් ඒවායින් <u>දෙකක්</u> පිළිබඳව කෙටි සටහන් ලියන්න.
(i) ශ්‍රී ලංකාවේ ග්‍රාම නිලධාරී සේවය
(ii) ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය කළමනාකරණය
(iii) පරිපාලන සංස්කෘතිය
(iv) නිළබල ක්‍රමය
(ලකුණු 10 බැගිනි)